# ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා ප්‍රවේශයක්
# (යෝජනා මාලාව) 1



## 1. ජාතික ගැටලුව හඳුනා ගැනීම

□ ලංකාවේ පූර්ව ධනේශ්වර සමාජ ක්‍රමය මත බ්‍රිතාන්‍යයන් විසින් ධනේශ්වර සමාජ ක්‍රමය උත්තරාරෝපණය කරනු ලැබීමෙන් පසු හා විශේෂයෙන් ලංකාවේ පාලන බලය දේශීය ධනපති පංතිය අතට මාරුවීමෙන් පසු ගෙවුණු ඉතිහාසය පුරාම ලාංකේය ජනතාව පීඩාවට පත්වූ ආර්ථික සමාජයීය ගැටලු අතර ජාතික ගැටලුව ප්‍රධාන තැනක් ගනී.

□ වරෙක මතුවෙමින්ද වරෙක තාවකාලිකව යටපත් වෙමින්ද වර්ධනය වූ මෙම ගැටලුව විවිධ පොරොන්දු, ගිවිසුම්, ජාතිවාදය ඇවිළවීම් හා
ජාතිවාදී කෝලාහල මගින් 1980 දශකය වන විට බෙදුම්වාදී සන්නද්ධ අරගලයක් දක්වා වර්ධනය විය. 2009 වසරේ මැයි මස බෙදුම්වාදී යුද්ධය නිම වුවද ඉන් පසු ගෙවුණු වසර 4ක කාලය තුළ ජාතික සමගිය ඇතිකිරීමේ දිශාවට, ජාතික ගැටලුව විසඳීමේ දිශාවට පියවර ගැනෙනවා වෙනුවට සිදුවූයේ බෙදුම්වාදය වෙනත් ආකාරයකින් යළි හිස ඔසවන තැනකට රට ඇද දැමීමය. දැන් මෙරට සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජනයා සිටින්නේ එම අනතුර අබිමුවය.

□ ජනතාව ජාතිකත්ව සීමා ඔස්සේ පියවරෙන් පියවර බෙදා වෙන්කරන හා එමගින් පන්තිය බෙදන දිශාවට යොමුව ඇති වත්මන් අනතුරුදායක තත්වය පරාජය කොට ජාතික සමගිය ගොඩනැගීමේ දිශාවට, ජාතික ගැටලුව විසඳීම සඳහා ආරම්භක ප්‍රවේශයක් ගැනීමේ දිශාවට ජාතික ගැටලුව පිළිබඳ සංවාදය යොමු කිරීම අත්‍යවශ්‍යය. මේ මොහොත වනවිට යළි උග්‍ර අතට හැරෙමින් පවතින ලංකාවේ ජාතික ගැටලුවට සැබෑ හා ස්ථිරසාර විසඳුමක් සොයා ගැනීමට නම් එය නිර්මාණය වූ අකාරයත් එය වර්ධනය වෙමින් ආ එහි ඓතිහාසික ගමන් මගත්, එහි වර්තමාන තත්වය හා ඒ හා බැඳුණු විවිධ දේශපාලන බලවේගයන්ගේ සම්බන්ධතාත් ඉතාම කෙටියෙන් හෝ නිවැරදිව හඳුනාගත යුතුවේ.

□ ලංකාවේ ජාතික ගැටලුව නිර්මාණය කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමය තුළය. බ්‍රිතාන්‍ය යටත්විජිතවාදීන් විසින් ලංකාව එකම ආර්ථික දේහයක් ඇති එක් මධ්‍යගත ධනේශ්වර රාජ්‍යයක් බවට පත්කළද ඒ තුළම ඔවුන් සිය පාලනයේ පහසුව සඳහා දැනුවත්ව හා සැලසුම්සහගතව පවත්වාගෙන ගිය 'බෙදා පාලනය කිරීමේ' උපායමාර්ගය නිසා ලංකාවේ ජීවත් වූ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්වයන් ස්වභාවිකව සිය ජාතිකත්ව සීමා වෙනස් කරගනිමින් එක් ජාතියක් ලෙස ස්වීකරණය වූයේ නැත. ලංකාවේ ජාතික ගැටලුවේ ආරම්භය එයයි.

□ ඉන්පසු බ්‍රිතාන්‍යයන් අතින් බලය ලබාගත් ලංකාවේ දේශීය සිංහල, දෙමළ, මුස්ලිම් ධනපති ප්‍රභූ පැලැන්තිය විසින් බලය ලබා ගැනීමට පෙර සිටම තම බලය හා වරප්‍රසාද සඳහා ජාතිවාදය යොදාගන්නා ලදී, ජාතිවාදය අවුළුවා ලන ලදී. ජාතිවාදී ලෙස ජනතාව සංවිධානය කිරීම හා දේශපාලන පක්ෂ ගොඩනැගීමද සිදුකරන ලදී; මේ දක්වාම බලය ලබා ගැනීම සඳහාත් බලයට හවුල්වීම සඳහාත් ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් ධනපති හා ප්‍රභූ කණ්ඩායම්වල පහසු හා ලාභදායී තේමාව වූයේ ජාතිවාදයයි. ඒ තුළ ලංකාවේ ජාතික ගැටලුව වර්ධනය විය.

□ ධනවාදය තුළ විවිධ ජන කොටස් අතර අසමානතාවයන් ස්ථාපිත වීමත්, ඒවා වඩ වඩාත් උත්සන්න වීමත් පොදු ජනතාව මුහුණ දෙන ප්‍රශ්න නොවිසඳීමත් ඒ නිසා අයිතීන් ඉල්ලා සංවිධානය වන, සටන් වදින, ජනතාව මර්දනය කිරීමත් ආදී ධනපති ක්‍රමයට ආවේණික සියලු පසුගාමී ක්‍රියාමාර්ග ජනතාව නිවැරදි අයුරින් වටහා ගත යුතු වුවත් සියලු ජාතිකත්වයන්ට අයත් ධනපති පංති කණ්ඩායම් ජාතිවාදී වුවමනාවන් ඉටුකරගැනීම සඳහා ධනවාදයේ පොදු අර්බුදයට හේතු ජාතිවාදී පදනම මත පිහිටා ඇති බවට පොදු ජනතාවට ඒත්තු ගන්වා ඇත. එයද ජාතික ගැටලුව උත්සන්න වීමට හේතුවකි.

□ ලංකාවේ ජාතික ගැටලුව පිළිබඳ ප්‍රශ්නයේදී විටින් විට සිංහල ධනපති පක්ෂ හා ප්‍රභූන් අතරත් දෙමළ ධනපති පක්ෂ හා ප්‍රභූන් අතරත් බලය සඳහා විවිධ ගිවිසුම් එකඟතා ඇතිකරගන්නා ලද අතර ඒ කිසිවක් ජාතික ගැටලුව විසඳීමට හෝ පොදුවේ දෙමළ හා මුස්ලිම් ජනයාගේ ඉතාම මූලික ප්‍රශ්න විසඳීමට සමත්වූයේ නැත. ඒ වෙනුවට ඒ සියල්ල මෙම ප්‍රශ්නය තව තවත් උග්‍ර කළේය. 1958 අත්සන් කළ බණ්ඩාරනායකචෙල "වනායගම් ගිවිසුමේ සිට 1966 ඩඩ්ලි-චෙල්වනායගම් ගිවිසුම, 1976 ජේ.ආර්.ජයවර්ධන-අමිර්තලිංගම් රහස් ගිවිසුම, 1987 ජේ.ආර්.-රජීව් ගිවිසුම, 2002 රනිල්-ප්‍රභාකරන් ගිවිසුම ආදී සියලු ගිවිසුම් ජාතික ගැටලුව සංකීර්ණ කළා මිස, එය තව තවත් උග්‍ර කළා මිස, ජාතිවාදී කෝලාහලවල සිට ජාතිවාදී යුද්ධයක් දක්වා ප්‍රශ්නය උග්‍ර කළා මිස එය විසඳුවේ නැත.

□ අනෙක් අතට ලංකාවේ ජාතික ගැටලුව රටේ අභ්‍යන්තර ප්‍රශ්නයක් පමණක් වූයේ නැත. සිය උපායමාර්ගික වුවමනාවන් අනුව ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයත් සිය කලාපීය වුවමනා මත ඉනදීයානු ාධිපත්‍යවාදයත" තම බල දෙශ් පාලන වවු මනා මත තමිලන් ාඩු ජාතිවාදයත් මෙයට දිගින් දිගටම මැදිහත් විය. වර්තමානයේදීද මැදිහත් වෙමින් ඇත. එබැවින් ලංකාවේ ජාතික ගැටලුව ලංකාවේ පසුගාමී ධනවාදයේත් අධිරාජ්‍යවාදයේත් ඉන්දියානු ආධිපත්‍යවාදයේත් ජාතිවාදයේත් සාමූහික නිර්මාණයක් ලෙස වටහා ගත යුතුය.

## 2. ජාතික ගැටලුවේ වත්මන් තත්වය

□ උතුරු පළාතේ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තීරණය කිරීමත් සමඟ පළාත් සභා පිළිබඳවත් ඒවායේ බලතල පිළිබඳවත් 13වන ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවත් ඉන්දු ලංකා ගිවිසුම පිළිබඳවත් සංවාදයක් හා මත ගැටුමක් රට තුළත් ආණ්ඩුව තුළත් ශ්‍රී ල.නි.ප.ය ඇතුළු ආණ්ඩුවේ කොටස්කාර පක්ෂ තුළ හා ඒ ඒ පක්ෂ අතරත් මතුවිය.

□ 13වන සංශෝධනය හා පළාත් සභා පිළිබඳ මතුවූ හා තවමත් පවතින මෙම සංවාදය හා මත ගැටුම ලංකාවේ ජාතික ගැටලුව විසඳීමේ දිශාවට හෝ ජාතික සමගිය ඇතිකිරීමේ දිශාවට යොමුවූවක් නොව උතුරේ යුද්ධය නිමවීමෙන් පසු කිසියම් ප්‍රමාණයකින් හෝ යටපත්ව තිබූ ජාතිවාදයටත් බෙදුම්වාදී මතවාදයටත් නව පණක් දෙන, ජාතිවාදය අවුළුවාලන එකක් වී තිබේ. මෙම මත ගැටුම සිංහල හෝ දෙමළ හෝ මුස්ලිම් හෝ ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් කෙරෙන ඔවුන්ගේ ප්‍රශ්න විසඳීම සඳහා හේතුවන එකක් නොව සැබෑ ජනතා ප්‍රශ්න යටපත් කරන හා සිංහල දෙමළ, මුස්ලිම් ධනපති, සුළු ධනපති ප්‍රභූ කණ්ඩායම්වල බල අරගලය වෙනුවෙන් සිදුවන්නකි.

□ 13වන සංශෝධනය පදනම්කර ගනිමින් දැනට සිදුවන මෙම මත ගැටුමේ දෙපාර්ශ්වය නියෝජනය කරන්නේ කවුද? එක් පසෙක උතුරට පොලිස් බලතල හා ඉඩම් බලතල සහිත පළාත් සභා එපා යයි කියන සිංහල ජාතිවාදී කණ්ඩායම් සිටින අතර අනෙක් පස සිටින්නේ අඩු නැතිව පළාත් සභා ඉල්ලන දෙමළ ජාතිවාදී කණ්ඩායම්, බෙදුම්වාදී සංවිධාන හා පුද්ගලයින්, ඉන්දියානු ධනපති ආණ්ඩුව හා අධිරාජ්‍යවාදීන්ය. එබැවින් මෙය ධනවාදය තුළ පීඩාවට පත් පොදු ජනතාවට ප්‍රයෝජනවත් සංවාදයක් හෝ ජනතාවගේ ඉල්ලීමක් නොවේ.

□ ලංකාවේ මෙතෙක් පැවති පාලනයන් සේම මහින්ද රාජපක්ෂ පාලනයද අත්‍යවශ්‍ය ලෙසම විසඳිය යුතු උතුරු හා නැගෙනහිර ජනතාවට බලපාන, විශේෂයෙන් උතුරේ දෙමළ ජනතාවට බලපාන ගැටලු සඳහා විසඳුම් ලබාදීම සිදුකළේ නැත. උතුරේ යුද්ධය නිමාවීමෙන් පසු ගෙවුණු වසර 04ක කාලය මුළුමනින්ම අපතේ යැවූ රාජපක්ෂ පාලනය දෙමළ ජනයාගේ මූලික වුවමනාවන් ඉටුකරමින් ඔවුන් ජාතික සමගියේ දිශාවට දිනාගන්නවා වෙනුවට, ඔවුන්ගේ දැවෙන ප්‍රශ්න නොසලකා හරිමින්, ඔවුන් මත සිය පාලනයේ ආධිපත්‍යය හා බලහත්කාරය පටවමින්, ඔවුන් භෞතිකවත් මානසිකවත් පීඩාවට ලක් කළේය. එය ජාතිවාදයත් බෙදුම්වාදයත් සවිමත් කිරීමට පමණක් හේතු විය. දෙමළ ජනතාවගේ අයිතීන් ස්ථාපිත කරමින් ඔවුන් දිනා ගන්නවා වෙනුවට ආණ්ඩුව කටයුතු කළේ කරුණා අම්මාන්, කේ.පී., හා දයා මාස්ටර් වැනි හිටපු එල්.ටී.ටී.ඊ. නායකයින් කිහිප දෙනෙක් වරදාන මගින් දිනාගෙන ඔවුන් මගින් ජනතාව හසුරුවා ගැනීමටය. මෙම සියලු තත්වයන් විසින් වර්තමාන අර්බුදය උත්සන්න කර තිබේ.

□ තිස් වසරක බෙදුම්වාදී යුද්ධය නිම වීමෙන් පසු මතුවූ තත්වය ජාතික ගැටලුව ඇතුළු රටේ දැවෙන ප්‍රශ්න විසඳීමේ දිශාවට යොදාගන්නවා වෙනුවට රාජපක්ෂ පාලනය සිදුකළේ, එම තත්වය තම බල ව්‍යාපෘතිය වෙනුවෙන් යොදා ගැනීමය. යුද්ධයේ හා යුද්ධය නිම වීමේ වාසිය යොදාගනිමින් නියමිත කාලයට පෙර විටින් විට පළාත් සභා ඡන්ද, නියමිත කාලයට පෙර ජනාධිපතිවරණය හා මහ මැතිවරණයද පවත්වා තම බලය තහවුරු කරගත් ආණ්ඩුව ඒ අතර අධිරාජ්‍යවාදී රටවලින් හා ඉන්දියාවෙන් එල්ල වූ බලපෑම හමුවේ අනුගමනය කළේ සියලු දෙනා රැවටීමට උත්සාහ කරන, ඒ මොහොතේ ප්‍රශ්නය මගහැර යන දෙබිඩි ක්‍රියාමාර්ගය. ඒ අනුව ඔහු රට තුළ ඊනියා දේශප්‍රේමී භූමිකාවක් රඟදක්වන අතරම අධිරාජ්‍යවාදයටත් ඉන්දියාවටත් විවිධ පොරොන්දු ලබා දුන්නේය. අවස්ථා කිහිපයකදීම ඉන්දියාවට පොරොන්දු දෙමින් 13වන සංශෝධනය ක්‍රියාවට නඟන බවටත් 13ට එහා ගිය බලයක් පළාත් සභාවලට දෙන බවටත් සහතික විය. 2013 සැප්තැම්බරයේ උතුරේ පළාත් සභා ඡන්දය පවත්වන බවට මුලින්ම සහතික වූයේදලාංකේය ජනතාවට නොව ඉන්දියාවටය. මෙම ක්‍රියාමාර්ගවල තර්කානුකූල අවසානය බවට පත්ව ඇත්තේ, බෙදුම්වාදය ශක්තිමත්වන අනතුරුදායක තත්වයකට රට පත්වීමය.

□ මෙම පශ්‍ර න්යෙදී එ.ජා.ප.යෙ" හැසරී මද ඉතාම හානකි ර එකක" විය. ජාතකි ගැටලුව පිළිබඳව එ.ජා.ප.ය. දිගටම කටයුතු කළේ අධිරාජ්‍යවාදයේ හා ඉන්දියානු ධනපති පංතියේ උපායමාර්ගයන්ට අනුවය. 1987 ඉන්දු- ලංකා ගිවිසුම අත්සන් කිරීම මෙහිලා ඉතාම බරපතළ හා හානිකරම අවස්ථාව විය. ලංකාවේ ජාතික ගැටලුවට සාධාරණ විසඳුමක් ලංකාව තුළ සොයාගන්නවා වෙනුවට ඉන්දියානු " විසඳුමක්" ලංකාව මත බලෙන් පැටවූ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කිරීම එ.ජා.ප.ය සිදුකළ දේශපාලන අපරාධයකි. ලංකාවේ ගැටලුවක් විසඳීම සඳහා වෙනත් රටක් (ඉන්දියාව) සමග ගිවිසුමක් අත්සන් කිරීම මගින් ලංකාවේ ස්වෛරීත්වයට හා ස්වාධීනත්වයට සිදුකළ හානිය විශාලය. ඉන්පසු 2002දී සටන් විරාම ගිවිසුම අත්සන් කිරීම හා සටන් විරාම නිරීක්ෂණය නෝර්වේ ඇතුළු විදේශ රටවල්වලට භාරදීම මගින්ද එ.ජා.ප.ය පෙන්නුම් කළේ තමන් අධිරාජ්‍යවාදටයත් ඉන්දියාවටත් යටත්වී කටයුතු කරන බවය. වර්තමානයේදීද එ.ජා.ප.ය කටයුතු කරනුයේ එම වැරදි මාවත තුළම සිටය.

□ ලංකාවේ ජාතික ගැටලුව අරභයා ඉන්දියාවේ මැදිහත්වීමද ලංකාවට හානිකර වී ඇත. එය මුල සිටම දකුණු ආසියානු කලාපයේ තම ආර්ථික හා දේශපාලන ආධිපත්‍යය පවත්වාගෙන යාම සඳහා ලංකාව තමන්ට අවනත කරගැනීම සඳහා ජාතික ගැටලුව යොදාගත්තේය. ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිවාදය පෝෂණය කිරීමේ සිට දෙමළ ජාතිවාදී කණ්ඩායම්වලට ඉන්දියානු භූමියේ සන්නද්ධ පුහුණුව ලබාදීම, මතවාදී හා ද්‍රව්‍යමය (අවි ආයුධ ඇතුළු) ආධාර ලබාදීම, රාජ්‍යතාන්ත්‍රික වටිනාකම් ලබාදීම, ඉන්දු-ලංකා ගිවිසුමෙන් ඉන්දීය පාලකයින්ගේ වුවමනාව ලංකාව මත පැටවීම හා ඉන්පසු සිදුකරන බලහත්කාරකම් හා බලපෑම් මගින් ඉන්දියානු හැසිරීම කුමක් සඳහාද යන්න තේරුම්ගත හැක. ඉන්දීය විදේශ ප්‍රතිපත්තිය බොහෝ විට ලංකාවට එරෙහිව හා ලංකාව මත තම ආධිපත්‍යය පැටවීම අරමුණු කරගත් එකක් විය. වර්තමානයේදීද 13වන සංශෝධනය ක්‍රියාවට නැංවීම සඳහා ඉන්දියාව, ශ්‍රී ලංකාවට නිතර නිතර සිදුකරන මැදිහත්වීම් ලංකාවේ ස්වාධීනත්වය හා ස්වෛරීත්වය උල්ලංඝනය කරන බව බැලූ බැල්මටම පෙනී යයි.

□ ලංකාවේ ජාතික ගැටලුව සම්බන්ධයෙන් ඉන්දියාවේ හැසිරීම මතුපිටින් "දෙමළ ජනයාගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා" ලෙස පෙනුනද හරයෙන් එය එසේ නොවේ. ඔවුන්ට ලංකාවේ දෙමළ ජනයාගේ ගැටලුව විසඳීමේ වුවමනාවක් නැත. ඉන්දියාවට අවශ්‍යව ඇත්තේ, තම බල වුවමනාවන් වෙනුවෙන්, තමිල්නාඩු දේශපාලනය කළමනාකරණය කර ගැනීමටත් ලංකාවේ ආර්ථික සම්පත් අත්පත් කරගැනීමත්ය. පසුගිය කාලය පුරාම ඉන්දියාව ලංකාවට දේශපාලන බලපෑම් කරමින් ආර්ථිකයට කඩාවැදී ලංකාවේ ඉදිකිරීම්වල කොන්ත්‍රාත් ලබාගත්තා මිස උතුර හා නැගෙනහිර ප්‍රදේශවල දෙමළ ජනතාවට අයිති ඉඩම් හා සම්පත් අත්පත් කරගත්තා මිස, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ධීවරයින්ගේ ධීවර කටයුතුවලට බාධා කරමින් ලංකාවේ මුහුදු සීමාව උල්ලංඝනය කරමින් ධීවර කටයුතු කළා මිස, ලංකාවේ දෙමළ ජනයාගේ ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික අයිතීන් වෙනුවෙන් සැබෑ ලෙස පෙනී සිටින ආරක්ෂකයා ලෙස කිසිවක් කළේ නැත. ඔවුන් සැබවින්ම කළේ තමන්ගේ රූකඩ බවට පත්කරගත හැකි දෙමළ ප්‍රභූ කණ්ඩායම් නඩත්තු කිරීමය. වර්තමානයේ කරමින් සිටින්නේද එයයි. □ උතුර, නැගෙනහිර හා රටේ සෙසු පළාත්වල වෙසෙන දෙමළ ජනතාවගේ ගැලවුම්කරුවන් ලෙස පෙනී සිටින බවක් ප්‍රදර්ශනය කරන දෙමළ දේශපාලන පක්ෂද ඒවායේ නායකයින්ද වෙනත් සංවිධාන හා පුද්ගලයින්ද ඒ හා සමානව රටේ සෑම පළාතකම වෙසෙන මුස්ලිම් ජනතාවගේ ගැලවුම්කරුවන් ලෙස ප්‍රදර්ශනය කරන මුස්ලිම් දේශපාලන පක්ෂද ඒවයේ නායකයින්ද වෙනත් සංවිධාන හා පුද්ගලයන්ද මෙතෙක් කළේ දෙමළ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්න ඉදිරියට දමා ඒවා ජාතිවාදී පදනමක පිහිටුවා තම ආත්මාර්ථකාමී බල ව්‍යාපෘති සාක්ෂාත් කර ගැනීමය. එනිසා පීඩාවට පත් දෙමළ හා මුස්ලිම් ජනතාව මුහුණ දී සිටින සැබෑ ප්‍රශ්නවලට ඉහත සඳහන් අයුරින් ජාතිවාදී පදනමක් මත

39 වන පිටට